**ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය**

*இலங்கையின் பிரதம அமைச்சர்*

**Prime Minister of Sri Lanka**

## මැයි දින පණිවුඩය

වැඩකරන ජනතා ලෙයින් දහදියෙන් පෝෂණය වූ අනාදිමත් ඉතිහාස සටහන් ඇති මාතෘභූමියක් තුළ, අප 137 වන ලෝක කම්කරු දිනය සමරමු.

අද අප එය සමරන්නේ ඉතිහාසයේ නොවූ විරූ ආර්ථික අර්බුදයක සටහන් මත ය. මෙවැනි අර්බුදවලට මුහුණ දුන් ලොව බොහෝ රාජ්‍යයන් නැවත ගොඩනැගුනේ වැඩකරන ජනතා ශක්තියෙනි. එය අපට ද උරුමය. නැවත ආර්ථිකය ගොඩනැගීමට ගොවි කම්කරු ජනතාව ආරම්භය ගෙන දුනි. පළමුව ගොවි ජනතාව අහරින් රට ස්වයංපෝෂනය කිරීමට පෙරමුණ ගත්තේය. එයාකාරයෙන්ම සෑම ක්ෂේත්‍රයක් තුළම නව පිබිදීමක් ඇතිවිය. එලෙස අප සිටි තත්ත්වයට වඩා හොඳ තත්ත්වයක් ලඟා කර ගැනීමට ලෝක කම්කරු දින අපි අදිටන් කර ගනිමු.

කිසිදු ගිවිසුමක් හමුවේ වැඩකරන ජනතා අයිතීන් නොසලකා හැරීමට අප කටයුතු නොකරමු. රජය, සේවක, සේව්‍ය යන ත්‍රෛයිපාර්ශික කතිකාවතින් ගන්නා තීන්දු තීරණ මත ඉදිරියට ගමන් කරමු.

වැඩකරන ජනතාව වෙත අප ලබාගත් ජයග්‍රහණ බොහෝය. එම ජයග්‍රහණ මත වැඩෙන ආර්ථිකයක් බවට රටම පත්කරගෙන කුමන්ත්‍රණකාරී බලවේගයන් හි උත්සාහයන් ආපසු හරවමින්, දිනූ අයිතීන් සුරකිමින් මව්බිම ගොඩනගන්නට මෙම ලෝක කම්කරු දිනයේ දී අදිටන් කර ගනිමු.

දිනේෂ් ගුණවර්ධන

අග්‍රාමාත්‍ය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

2023.04.30